**ශීර්ෂය 331 - දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 331 - දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුනි 17 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 54,759.85 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 52,330.09 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුවේ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2,429.76 ක් හෙවත් සියයට 4.44 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 53,439.90 | 51,306.09 | 2,133.81 | 3.99 |
| මූලධන | 1,319.95 | 1,024.00 | 295.95 | 22.42 |
| **එකතුව** | **54,759.85** | **52,330.09** | **2,429.76** | **4.44** |

(ආ) **වෙනත් අමාත්‍යාංශ විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දෙපාර්තමේන්තුව වෙත නිවාස සහ සමෘද්ධි අමාත්‍යාංශය විසින් එකතුව රු.මිලියන 1,363.4 ක ප්‍රතිපාදන ලබා දී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,182.0 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබූ ප්‍රතිපාදනවලින් රු.මිලියන 181.4 ක් හෙවත් සියයට 13.30 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 33101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 235.0 | 221.5 | 90.0 | 206.7 | 100.0 | 14.8 |

## 2.3 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0431/0015/000 දරන අග්‍රිම ගිණුමෙහි 2015 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු.මිලියන 1,019.8 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම්

දෙපාර්තමේන්තුව යටතේ වූ පොදු තැන්පත් ගිණුම් 03 ක 2015 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 2,600.0 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0015/0099/000 | 2,449.4 |
| 6000/0000/00/0015/0205/000 | 150.4 |
| 6000/0000/00/0015/0160/000 | 0.2 |
| | 2,600.0 |

2.5 **විගණන නිරීක්ෂණය**

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | **අදාල රෙගුලාසිය** | **නිරීක්ෂණ** |
|---|---|---|---|
| (අ) | රාජකාරි දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845 (1) ප්‍රකාර 26 වැනි පරිශිෂ්ඨය | පවත්වා නොතිබුණි. |
| (ආ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891 (1) | පවත්වා නොතිබුණි. |
| (ඇ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454 (2) | පවත්වා නොතිබුණි. |
| (ඈ) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | පවත්වා නොතිබුණි. |
| (ඉ) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 802 හා 1647 (ඇ) සහ (ඉ) | පවත්වා නොතිබුණි. |
| (ඊ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (උ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |

3.2 **විගණන සාක්ෂි නොවීම**

මොණරාගල සංචාරක බංගලාව පිහිටි දිස්ත්‍රික් කාර්යාල ඉඩම හා ගොඩනැඟිලි සහ දක්ෂිණ සංවර්ධන මූලා සමාගම පිහිටි ඉඩම සම්බන්ධ ලිපිගොනු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එම දේපලවල වටිනාකම පිළිවෙලින් රු.මිලියන 27.90 ක් හා රු.මිලියන 11.96 ක් වී තිබුණි.

3.3 **විගණන විමසුම්වලට පිළිතුරුදීම**

-----------------------------------

දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 17 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර ප්‍රමාද කාලය මාස 2 ක සිට මාස 15 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණි. එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.මිලියන 2,009.34 ක් විය.

3.4 **විසර්ජන ගිණුම**

-----------------

3.4.1 **අයවැය විචලනය**

--------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු එකතුව රු. මිලියන 11.20 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයන් 24 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු එකතුව රු. මිලියන 272.87 ක් ඉතිරිවී තිබූ අතර එය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 40 ක සිට සියයට 95 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

3.5 **අග්‍රිම ගිණුම්**

-------------

2016 මාර්තු හා අප්‍රේල් මාසවලදී දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා දිස්ත්‍රික් කාර්යාල විසින් පියවා තිබූ අග්‍රිම ශේෂය රු. මිලියන 24.69 ක් වී තිබුණත්, 2016 ජූලි 07 දින වන විටත් භාණ්ඩාගාරය වෙත පියවීම දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාද කර තිබුණි.

3.6 **පොදු තැන්පත් ගිණුම**

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් කාර්යාලවලට අදාළ පොදු තැන්පත් ගිණුමෙහි භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත හා තැන්පත් ලේඛන අතර රු.මිලියන 14.96 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ඊට අදාල කේවල ශේෂ ලැයිස්තු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2013 වර්ෂයේදී සමෘද්ධි සහනාධාර ගෙවීම සඳහා බැංකු මූලා අංශයේ ආයෝජනවලින් ලබා ගෙන තිබුණත්, එම මුදලින් ආපසු නොපියවූ රු. මිලියන 2,449.50 ක් පොදු තැන්පත් ගිණුමෙහි රඳවා ගෙන තිබුණි.

3.7 **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

--------------------------------------------------------------

විෂය අංක 33101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු ප්‍රකාරව 2015 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරුවී ගිය, මියගිය, විශ්‍රාම ගිය හා සේවයෙන් පහකළ නිලධාරීන් 67 ක ගෙන් අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 4,372,194 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ මාස 01 ක සිට වර්ෂ 21 ක් දක්වා

කාල පරාසයක සිට පැවත එමින් තිබුණි. එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව තිබූ ලැබිය යුතු ණය ශේෂය රු. මිලියන 130.16 ක් වූ අතර එම ණය ශේෂය අයකර ගැනීම සඳහා සිදු කළ පසුවිපරම් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3.8 **යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

---

3.8.1 **අභ්‍යන්තර විගණනය**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 හා 2015 වර්ෂ වෙනුවෙන් නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන විමසුම් 1,485 ක් සඳහා පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර එම විමසුම් සම්බන්ධව ප්‍රමාණවත් පසුවිපරම් කිරීමක් සිදුකර නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේ අභ්‍යන්තර විගණන කාල සටහනට අනුකූලව විගණන කටයුතු සිදු කිරීමට අපොහොසත් වී තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, දිවිනැගුම ප්‍රජා මූල බැංකු හා බැංකු සමිති 1,378 ක් ද, සමාජ ආරක්ෂණ අරමුදල ඇතුළු අරමුදල් 03 කද විගණනය සිදුකර නොතිබුණි. තවද, ප්‍රධාන කාර්යාලය සඳහා ද ප්‍රමාණවත් විගණනයක් සිදු කර නොතිබුණි.

3.8.2 **විගණන හා කළමනාකරණ කමිටුව**

---

අවම වශයෙන් කාර්තුවකට වරක් විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර දෙකක් පමණක් පවත්වා තිබුණි.

3.9 **වත්කම් කළමනාකරණය**

---

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ විසර්ජන ගිණුමේ ජංගම නොවන වත්කම් සංචලන වාර්තාවේ ඇතුළත් මුළු වත්කම් වටිනාකම රු. මිලියන 1,235.21 ක් වුවද, ඊට අදාළ උපලේඛනයේ ශේෂය රු. මිලියන 1,121.16 ක් වූයෙන් රු. මිලියන 114.05 ක වෙනසක් නිරීක්ෂණය විය. "පවරා ගනු ලැබූ ආයතන විසින් නිසි පරිදි වත්කම් ලේඛන පවත්වා නොතිබීම මේ සඳහා හේතුවී තිබූ බව" අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අදහස් දැක්වීම කර තිබුණි.

(ආ) **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---

ඉඩමේ නිරවුල් භුක්තිය පවරා නොගත් ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ මහල් තුනකින් යුත්, පුහුණු මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන යන ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.1,618,329 ක නඩත්තු වියදමක් කර තිබුණි. ප්‍රමාණවත් පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු නොකිරීම හේතුවෙන් එම ගොඩනැගිල්ල, උපකරණ සහ කාර්ය මණ්ඩලය ඌන උපයෝජිතව පැවතුණි. "ඉදිරියේදී මෙම ගොඩනැගිල්ල දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයට පවරා දීමට කටයුතු කරමින් පවතින බව " අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විගණනය වෙත දන්වා එවා තිබුණි.

(ඈ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමීක්ෂණ වාර්තාවලින් පෙන්වා දී තිබුණු ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. 2014 හා 2015 වර්ෂවල බැංකු ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදලේ අපහරණය කළ යුතු තොගයේ වටිනාකම පිළිවෙලින් රු.1,187,288 ක් හා රු.1,207,793 ක් වූ අතර දෙපාර්තමේන්තුවේ අනෙකුත් සමීක්ෂණ මණ්ඩල වාර්තා තුළ ඇතුළත්ව තිබූ අපහරණය කළයුතු තොගවල වටිනාකම ගණනය කර නොතිබුණි.

(ii) බැංකු ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදලේ 2014 හා 2015 වර්ෂවල තොග ඌනතාවය පිළිවෙලින් රු.466,185 ක් හා රු.384,063 ක් ද, තොග අතිරික්තය පිළිවෙලින් රු.376,937 ක් හා රු.132,676 ක් ද වූ අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) **බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

--------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා නොගෙන දෙපාර්තමේන්තුව සතු වාහන 23 ක් රජයේ ආයතන 06 ක් සහ පෞද්ගලික පාර්ශවයක් වෙත ලබාදී තිබුණි. අමාත්‍යාංශ දෙකකට ලබාදුන් වාහන නඩත්තු කිරීම සඳහා ඉකුත් වර්ෂයේදී රු.242,422 ක් ද, සමාලෝචිත වර්ෂයේදී රු.574,557 ක් ද වශයෙන් එකතුව රු.816,979 ක් දෙපාර්තමේන්තුව විසින් වැය කර තිබුණි.

(ii) ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය විසින් බදු දී තිබූ ඉඩම් හා ගොඩනැඟිලි දේපල 09 ක් දෙපාර්තමේන්තුව වෙත පවරා ගෙන අදාළ බදුකරුවන් සමඟ නව ගිවිසුම්වලට එළැඹීමට කටයුතු කර නොතිබුණි. තවද, අධිකාරියට අයත්ව තිබූ ලෙස සලකා බදු දී මේ වන විට බදු කාලය අවසන්ව තිබූ දේපල 06 ක් වෙනත් රාජ්‍ය ආයතනයකට අයිති බව ප්‍රකාශ කර ඇති බැවින් ඒවාට අදාළ නිරවුල් කිරීම් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය විසින් බදු දී තිබූ දේපල 11 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ බදුකුලී සහ දඩ මුදල් වශයෙන් දෙපාර්තමේන්තු පොත් අනුව රු.1,671,898 ක් අයවිය යුතුව පැවතුණි.

(ඉ) **පවරා නොගත් වත්කම් පරිහරණය කිරීම**

**--------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුවට ඒකාබද්ධ කරන ලද ආයතන විසින් භාණ්ඩාගාර චක්‍රලේඛ ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොතිබූ හෙයින් එම ආයතන සතු බවට අවසන් වරට සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත්ව තිබූ රු. මිලියන 1,526.55 ක වත්කම් සියල්ලම නිවැරදිව පවරා ගෙන තිබුණු බව සනාථ කර ගැනීමට නොහැකි විය.

(ii) දෙපාර්තමේන්තුවට අනුබද්ධ කළ ආයතන සතුව පැවැති වාහන 128 ක් පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

(iii) ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පුහුණු පර්යේෂණ ආයතනයේ යතුරු පැදි 10 කට අදාළ ලිපිගොනු භාරගෙන තිබුණද ඒවා භෞතිකව භාරගෙන නොතිබුණි.

(iv) ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය විසින් ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි ඉඩමට 2004 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා රු.38,077,500 ක බදුකුලී ගෙවා තිබුණි. බදු ගිවිසුම් ප්‍රකාරව ඉදිකිරීම් කටයුතු සිදු නොකිරීම හේතුවෙන් බදු ගිවිසුම අවලංගු කර තිබූ අතර එම කාලය තුළ ගබඩා ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. බදු කාලය දීර්ඝ කරවාගෙන දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය එම ඉඩම තුළ ඉදිකිරීමට අපොහොසත් වීම හේතුවෙන් දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇති සෙත්සිරිපාය පරිශ්‍රය සඳහා මාසිකව රු. මිලියන 4.25 බැගින් කුලියක් ගෙවීමට සිදු වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එසේ ගෙවා තිබූ මුළු ගොඩනැගිලි කුලිය රු. මිලියන 571.07 ක් විය.

(ඊ) **බේරුම් නොකළ බැරකම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය අවසානයට බේරුම් නොකළ බැරකම්වල වටිනාකම රු. මිලියන 8,428.36 ක් වූ අතර, එයින් රු. මිලියන 8,415.78 ක් වූ බැරකම් වර්ෂ 1 ක සිට වර්ෂ 3 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) වැය විෂයයන් 3 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.මිලියන 5,427.89 ක බැරකම්වලට එළඹ තිබුණි.

(iii) 'ඉසුරුමත් නිවහනක්' වැඩසටහන ක්‍රියාත්මක කිරිම සඳහා 2014 වර්ෂයේදී රු.මිලියන 2,992.78 ක බැරකමකට එළඹ තිබුණි. සමාලෝචිත වර්ෂයේදී බැරකමක් වශයෙන් විසර්ජන ගිණුමේ දක්වා තිබුණද එවැනි බැරකමක් ඇතිකර ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදන සලසා නොතිබුණි. "උක්ත බැඳීම් වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇති බව" අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විගණනය වෙත දන්වා තිබුණි.

## 3.10 අනුකූල නොවීම්

### 3.10.1 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) 2013 අංක 1 දරන දිවිනැගුම පනත** | | |
| (i) (i) 9 වන වගන්තිය | - | දිවිනැගුම ප්‍රතිලාභීන්ගේ ස්වෙච්ඡා සහභාගිත්වයෙන් යුතු දිවිනැගුම ප්‍රජා මූල සංවිධාන පිහිටුවා නොතිබුණි. |
| (ii) (ii) 34 වන වගන්තිය | - | සියළුම දිවිනැගුම ප්‍රජා මූල බැංකුවලින් සහ සියළුම දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිතිවලින් සමන්විත දිවිනැගුම ප්‍රජා මූල බැංකු මහා සංගමයක් පිහිටුවා නොතිබුණි. |
| (iii) (iii) 36 වගන්තිය | - | පනතේ නියමකර ඇති කාර්යයන් සඳහා දිවිනැගුම සංවර්ධන අරමුදලක් ඇතිකර නොතිබුණි. |
| (iv) (iv) 37 වගන්තිය | - | දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට ඒකාබද්ධ කළ අධිකාරිවල පැවති සියළු මුදල් බැර කරමින් පිහිටුවිය යුතු දිවිනැගුම චක්‍රීය අරමුදල පිහිටුවා නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 103(1) | 668,325 | 2011 වර්ෂයේ අනතුරට පත් ලොරි රථයේ ප්‍රාරම්භක වාර්තා හා පරිපූරක වාර්තා ඉදිරිපත් කර තිබූ නමුත් එම අලාභය අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 763 | - | ප්‍රධාන කාර්යාලයේ ගබඩා භාණ්ඩ සහ ලිපි ද්‍රව්‍ය චක්‍රීය අරමුදලේ තොග සම්බන්ධයෙන් ගබඩා ව්‍යවස්ථා සම්පාදනය කරගෙන නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 880 | - | රජයේ වත්කම් බාරව කටයුතු කරන කිසිදු නිලධාරියකුගෙන් රජයේ නිලධාරීන්ගේ ඇප අඥාපනතට අනුකූලව ඇප ලබාගෙන නොතිබුණි. |

(ඇ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| (i) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90දරන චක්‍රලේඛයේ 2.11 ඡේදය | - | මාස 06 කට වරක් දෙපාර්තමේන්තුව සතු වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |
| (ii) | 1994 අගෝස්තු 03 දිනැති අංක 26/92(1) දරන චක්‍රලේඛය | - | නිලධාරීන්ට වෙන්කළ වාහන හැර අනිකුත් වාහනවල රාජ්‍ය ලාංඡනය සහ දෙපාර්තමේන්තුවේ නම පිංතාරු කිරීමට කටයුතු කර නොතිබුණි. |

3.10.2 **බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 මාර්ගෝපදේශය ප්‍රකාරව එකතු කළ අගය මත බදු ආවරණය සඳහා ගෙවූ මුදල් පිළිබඳ විස්තර විගණකාධිපතිවරයාට පිටපත් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු වුවත්, නියැදි විගණන පරීක්ෂාවට අනුව සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු.5,771,225 ක බදු මුදල් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය විසින් පාවිච්චි කළ වාහන සඳහා සුඛෝපභෝගී හා අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය බදු මුදල් ගෙවා නොතිබුණි. නමුත් එම බදු මුදල් හා දඩ මුදල් එකතුව රු.1,284,000 ක් දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි.

3.11 **බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 395(ඇ) ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ නිල බැංකු ගිණුම සහ ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදල් බැංකු ගිණුමේ බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ දීර්ඝ ප්‍රමාදයන් පැවතුණි.

(ආ) නිල බැංකු ජංගම ගිණුමෙහි බැංකු ප්‍රකාශය අනුව 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.715,750,526 ක් වුවද, එදිනට නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ මුළු චෙක්පත් 682 ක වටිනාකම රු.1,055,870,433 ක් වීමෙන් නිකුත්කළ චෙක්පත් පියවීමට බැංකු ශේෂය ප්‍රමාණවත් වී නොතිබුණි. එම ඉදිරිපත් නොකළ චෙක්පත් තුළ මාස 06 ක හෝ ඊට වැඩි කාලයක් ඉක්මවා තිබුණු එකතුව රු.122,787 ක් වටිනා චෙක්පත් 33 ක් ද, අවලංගු කරන ලද රු.1,329,737 ක් වටිනා චෙක්පත් 13 ක් ද, පැවැතී තිබුණත්, 2015 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනයේ හඳුනා නොගත් බැංකු බැර රු.5,323,468 ක් ද, හඳුනා නොගත් බැංකු හර රු.31,554,687 ක් ද, මාස 01 ක සිට මාස 08 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එන තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ රු.265,333 ක් වටිනා චෙක්පත් 09 ක් ද ඇතුළත් වී තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවට ඒකාබද්ධ කරන ලද ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ නිල බැංකු ගිණුම 2015 සැප්තැම්බර් 21 දින පියවා තිබුණ ද, එමගින් ප්‍රතිපාදන ලබා දී තිබූ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 42 ක බැංකු ගිණුම්වල රු.3,622,105 ක ශේෂ ඊට පසුව පියවා තිබීමෙන් එම බැංකු ගිණුම් අනුචිත පරිහරණයකට ඉඩකඩ සැලසී තිබුණු බව නිරීක්ෂණය විය.

## 3.12 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදලේ ගබඩාවේ තොග සත්‍යාපන වාර්තාවේ ඇතුළත් භෞතික ශේෂය හා පොත් ශේෂය අතර වෙනසක් නිරීක්ෂණය නොවූවද, විගණනයේදී කරන ලද ගණනය කිරීම් අනුව තොග වාර්තාවල ලිපිද්‍රව්‍ය වර්ග 05 ක 2015 දෙසැම්බර් 31 දිනට ඒකක 177,400 ක තොග ශේෂයක් අඩුවෙන් සටහන් කර තිබූ අතර එහි වටිනාකම රු.1,053,802 ක් විය.

## 3.13 අවිධිමත් ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් එළැඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම

දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් දිවිනැගුම කාර්යාල විසින් සිදු කර තිබුණු ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දිවිනැගුම ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා රු.4,098,577 ක් වටිනා භාණ්ඩ වර්ග 20 ක් මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.1, 4.3, 6.33, 5.1 හා 5.2 යන මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 මාර්ගෝපදේශයෙන් බැහැරව ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 02 ක් ඉක්මවා, පිටිපන හා නෑබඩ දිවිනැගුම ප්‍රජාමූල බලකා විසින් පිළිවෙලින් රු.මිලියන 2.55 ක් හා රු.මිලියන 2.50 ක් වූ බැංකු ගොඩනැගිලි ඉදිකිරීම් ග්‍රාමීය සමෘද්ධි බලකායන් 03 ක් වෙත පවරා තිබුණි. එම බලකා විසින් ගිවිසුම් ප්‍රකාරව, කොන්ත්‍රාත්තුවට අදාල ලියකියවිලි කිසිවක් පවත්වා නොතිබුණි.

### (ආ) අධිකාර බලය නොමැති වූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වන දිවිනැගුම ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති වැඩසටහන් සඳහා දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ / දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අනුමැතියකින් තොරව රු.870,000 ක වියදමෙන් ජුකී මැෂින් 30 ක් මිලදී ගෙන තිබුණි.

(ii) අවස්ථා 37 කදී කාර්මික නිලධාරියෙකුගේ පරීක්ෂාවකින් තොරව වාහන අළුත්වැඩියා කර ඒ සඳහා දෙපාර්තමේන්තුවේ මූල්‍ය බලතල සීමාව ඉක්මවා අනුමත කරන ලද අළුත්වැඩියාවන් සඳහා එකතුව රු.මිලියන 1.16 ක් ගෙවා තිබුණි.

3.14 **අනාර්ථික ගනුදෙනු**

-----------------------

ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය විසින් ඉඩම් දෙකක් අත්පත් කර ගැනීම සඳහා රු.මිලියන 2.65 ක් තැන්පත් කර තිබුණ ද, එම ඉඩම් අත්පත් කරගැනීමට හෝ තැන්පතු නිරවුල් කර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

3.15 **කළමනාකරණ දුර්වලතා**

-----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) 2013 හා 2014 වර්ෂවලදී සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිලාභීන් 105 දෙනෙකු වෙත ලබාදී තිබූ ණයවලින් රු.මිලියන 3.16 ක් අය නොවන අක්‍රීය ශේෂ බවට පත් වී තිබුණි.

(ආ) උපරිම වාර්තා පදනම් කරගෙන සහනාධාර ගෙවීම සඳහා දිවිනැඟුම බැංකු වෙත යවන ලද මුදලින් තථ්‍ය සහනාධාර වියදම, අතිරේක අග්‍රිම හා ආපසු ලද ඉතිරි මුදල් මාසිකව සැසඳීම් කර නිවැරදි සහනාධාර වියදම ගණනය කර නොතිබුණි. ඒ අනුව සහනාධාර ගෙවා ඉතිරි වූ මුදල් සියළුම බැංකු විසින් ප්‍රධාන කාර්යාලය වෙත ආපසු එවා තිබුණු බව තහවුරු නොවූ අතර, භාණ්ඩාගාරය වෙත වාර්තා කරන ලද සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 39,994.33 ක් වූ සහනාධාර වියදම නිවැරදි නොවන බව 2016 ජුලි මාසයේ මාරු පත්‍රයක් මගින් සමාලෝචිත වර්ෂයට අදාළ රු.මිලියන 32.39 ක වියදම 2016 වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කිරීමට ගත් අවසරයෙන් අනාවරණය විය.

(ඇ) ප්‍රතිලාභීන්ගේ නිවාස ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුමක් ලබාදීමේ අරමුණ ඇතිව මාසිකව දිනුම් ඇදිය යුතු නිවාස සංවර්ධන ලොතරැයි දිනුම් ඇදීම 2012 හා 2013 වර්ෂයන්හි යාවත්කාලීන නොවූ තොරතුරු පද්ධතියක් උපයෝගී කරගෙන එකවර දිනුම් ඇදීම සිදු කර තිබුණි. මේ හේතුවෙන් තොරතුරු සොයාගත නොහැකි වූ ත්‍යාග හිමිකරගත් සහනාධාරලාභීන් 151 දෙනෙකු වෙත රු.මිලියන 22.65 ක මුදලක් ප්‍රදානය කිරීමට නොහැකි වී තිබුණි.

(ඈ) රටවිරු නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ සමාලෝචිත වර්ෂය අවසාන වන විට දිස්ත්‍රික්ක 23 ක ශ්‍රමිකයින් 8,850 දෙනෙකු වෙත නිවාස තනාගැනීම වෙනුවෙන් රු. මිලියන 1,159.52 ක ණය ප්‍රදානය කර තිබුණි. එම ණය මුදලින් ශ්‍රමිකයන් 1,625 දෙනෙකුට ලබා දී තිබූ රු.මිලියන 132.68 ක ණය ගෙවීම පැහැර හැර තිබුණි. එම මුදල් රු.මිලියන 100 ක් වූ තැන්පතු මුදලින් පියවා ගැනීමේ හැකියාවක් තිබේද යන්න තහවුරු කරගෙන නොතිබුණි.

(ඉ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලබාදුන් ප්‍රතිපාදන උපයෝගී කරගෙන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙන් බැහැරව තෝරාගත් සැපයුම්කරුවන්ගෙන් උළු මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 9.77 ක් වැයකර උළු මිලදී ගෙන තිබුණි. වර්ෂය අවසානයේදී මෙම වැඩ සටහන අතරමඟ නවතා තිබුණි. තවද, නිවසක් තනාගැනීමට හැකියාවක් නොමැති අයට උළු පමණක් ලබාදීම හේතුවෙන් ප්‍රතිලාභීන්ට උළු සෙවිලි කර ගැනීමට නොහැකි වී තිබූ අවස්ථාවන් නිරීක්ෂණය විය.

(ඊ) දෙපාර්තමේන්තුවේ විෂය පථයෙන් බැහැරව, භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් 194 දෙනෙකු වෙත යතුරු පැදි මිලදී ගැනීම සඳහා 2014 හා 2015 වර්ෂවලදී දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති මගින් රු.මිලියන 9.69 ක ණය මුදල් ලබාදී තිබූ අතර එයින් මන්ත්‍රීවරුන් 124 දෙනෙකුගෙන් රු.මිලියන 3.09 ක් තවදුරටත් අයවිය යුතුව පැවතුණි.

(උ) දක්ෂිණ සංවර්ධන අධිකාරියට අයත් රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි අක්කර 01 විශාල පනිල්කන්ද තේ කර්මාන්තශාලා ඉඩම අත්පත් කර ගැනීම සඳහා ගෙවීමට නියමිතව තිබූ රු.මිලියන 2.98 ක මුදල ගෙවා අත්පත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) 1997 ජූනි 17 දිනැති අංක 980/22 දරන ගැසට් පත්‍රය මගින් දක්ෂිණ සංවර්ධන අධිකාරියට, මාතර හා ගාල්ල දිස්ත්‍රික්කවල අක්කර 110 ක ඉඩම් අත්පත් කර ගැනීම සඳහා අනුමත කර තිබුණද, එම ඉඩම් අත්පත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(අ) ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදල භාරව සිටි ගබඩා භාරකරු භාරයේ පැවති ගබඩා ලිපිද්‍රව්‍ය හා තොග පොත් නව ගබඩා භාරකරුට භාර දීමෙන් තොරව 2014 වර්ෂයේදී වන්දි හා පාරිතෝෂික ප්‍රදානය කර සේවයෙන් විශ්‍රාම ගත්වා තිබුණි. නව ගබඩා භාරකරු එදිනට ගණනය කර ලේඛන ගත කරන ලද රු.මිලියන 1.87 ක් වූ ලිපි ද්‍රව්‍ය වටිනාකම නිවැරදිබවට තහවුරු කර නොගෙන ගබඩාව භාර ගැනීමට කටයුතු කර තිබුණි.

## 3.16 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 665 | 86 | 579 | - |
| (ii) තෘතියික මට්ටම | 245 | 36 | 209 | - |
| (iii) ද්විතියික මට්ටම | 31,092 | 23,606 | 7,486 | - |
| (iv) ප්‍රාථමික මට්ටම | 762 | 210 | 552 | - |
| (v) වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 30 | - | 30 |
| **එකතුව** | **32,764** | **23,968** | **8,826** | **30** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුවේ නව සේවා ව්‍යවස්ථා අනුමත කරගැනීමේ ප්‍රමාදය හේතුවෙන් බඳවා ගැනීම් හා උසස් කිරීම් ප්‍රමාදවීම මත සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 8,826 ක් පිරවීමට නොහැකි වී තිබුණි.

(ii) මාණ්ඩලික නිලධාරි තනතුරුවලින් සියයට 87 ක් පුරප්පාඩු වී පැවති අතර එම තනතුරුවලින් කොටසක් වැඩ ආවරණය කිරීමේ පදනම මත බඳවා ගෙන තිබුණි.

(iii) තනතුරු නාම 17 ක් යටතේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරින් 327 ක් ඇතුළුව නිලධාරින් 423 ක සමස්ත කාර්ය මණ්ඩලයක් කළාප කාර්යාල 5 ක් සඳහා 2014 නොවැම්බර් 19 දින අනුමත කර තිබුණද, 2015 වර්ෂය ආරම්භයේදී කළාප කාර්යාල අහෝසි කිරීමත් සමඟ කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී ද්විතීය මට්ටමේ සේවකයන් 15 දෙනෙකු විවිධ අමාත්‍යාංශ හා අමාත්‍ය කාර්ය මණ්ඩල සඳහා මුදාහැර තිබුණි.

(ඇ) දිවිනැගුම සංවර්ධන නිලධාරින්ගේ විභාග සහතිකවල පවතින ගැටළුකාරි බව සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) බඳවා ගැනීම් හා උසස්වීම් ලබා නොදෙන ලෙස ජාතික වැටුප් හා සේවක කොමිෂන් සභාව විසින් 2011 මැයි 13 දිනැති ලිපියකින් දැනුම් දී තිබියදී සහ ඒ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය විසින් ලබා දී තිබූ උපදෙස්වලින්ද බැහැරව, බඳවා ගැනීම් පරිපාටි අනුගමනය කිරීමකින් තොරව එක් නිලධාරියෙකු 2011 අගෝස්තු 03 දින සිට සහකාර අධ්‍යක්ෂ තනතුරක් සඳහා උසස් කර තිබුණි.